සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

6 ශ්‍රේණිය | විද්‍යාව | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- පළමු කොටස සඳහා මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එයට ලකුණු 16 ක් ලැබේ. ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01. දිග මැනීමට යොදාගන්නා අන්තර්ජාතික ඒකකය කුමක් ද?
(1) මිලි මීටර් (2) නැනෝමීටර් (3) මීටර් (4) කිලෝමීටර්

02. ජලයේ ඝන අවස්ථාව සඳහා උදාහරණ පෙන්වන්නේ,
(1) අයිස්, හුමාලය, හිම (2) හුමාලය, ජලවාෂ්ප, ජලය
(3) ජල වාෂ්ප, අයිස්, ජලය (4) ග්ලැසියර්, අයිස්, හිම

03. දකුණු පස රූපයේ පෙන්වන්නේ විදුලිබාලාගාරයකි. එය ක්‍රියාත්මක වන්නේ,



(1) මුහුදු රළ මඟින්
(2) උදම් රළ මඟින්
(3) න්‍යෂ්ටික බලයෙන්
(4) භූ තාපය මගින්

04. කිවුල් ජලය ආශ්‍රිතව වැවෙන සුවිශේෂී අනුවර්තන දරණ ශාකයකි,
(1) කිරල (2) දිය කඳුරු
(3) කුඹුක් (4) උණ

05. මිරිදිය, කරදිය, කිවුල් දිය පවතින ස්ථාන පිළිවෙලින් දැක්වෙන්නේ,
(1) ගංගා, මුහුදු, වැව් (2) ළිං, ගංගා, සාගර
(3) පොකුණු, ළිං, කලපු (4) ළිං, සාගර, කලපු

06. ස්වාභාවික ශබ්ද පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) සීනු හඬ, කුරුළු නාදය (2) ගෙරවුම් හඬ, මුහුදු රළ නැගීම
(3) සුළගේ හඬ, බෙර ශබ්දය (4) නළා හඬ, රැහැයියන්ගේ නාදය

07. සිසුවෙකු පැවසූ යම් ප්‍රකාශයක් හා හේතුවක් පහත දැක්වේ.
ප්‍රකාශය - වීදුරු කැපීම සඳහා දියමන්ති භාවිත කරයි.
හේතුව - දියමන්ති දැඩි බවින් අධික බැවිනි.
ඒ අනුව
(1) හේතුව සත්‍ය අතර ප්‍රකාශය අසත්‍ය වේ. (2) ප්‍රකාශය සත්‍ය අතර හේතුව අසත්‍ය වේ.
(3) හේතුව හා ප්‍රකාශය අසත්‍ය වේ. (4) ප්‍රකාශය හා හේතුව සත්‍ය වේ.

08. පිළිවෙලින් ස්වයංපෝෂී ජීවියෙකු හා විෂමපෝෂී ජීවියෙකු සඳහන්කර ඇති පිළිතුර තෝරන්න.

(1) අඹ, කෝට්ටෝරුවා (2) කොස්, දෙල්

(3) ගවයා කොටියා (4) කොටියා, නයා

09. චුම්බක පිළිබඳ සත්‍ය වගන්තිය තෝරන්න.

(1) සජාතීය චුම්බක ධ්‍රැව ආකර්ෂණය වේ.

(2) චුම්බකවලට සියලුම ලෝහ ආකර්ෂණය වේ.

(3) දණ්ඩ චුම්බකයක වැඩිම බලයක් ඇත්තේ චුම්බකය මධ්‍යයේ ය.

(4) විජාතීය චුම්බක ධ්‍රැව ආකර්ෂණය වේ.

10. සංචරණය කළ නොහැකි නමුත් චලන පෙන්වන සතුන් අඩංගු වන්නේ,

(1) මුහුදු මල, කොරල් බුහුබාවන් (2) තාපස කකුළුවා, මුහුදු අශ්වයා

(3) පැරමීසියම්, ඇමීබා (4) සමනලයා, මුවා

11. පහත රූපයේ ආකාරයට හිස් බෝතලයක් ජලයේ ගිල්වන ලදී ඒ සම්බන්ධයෙන් <u>අසත්‍ය</u> ප්‍රකාශය කුමක් ද?

(1) බෝතලය තුළට ජලය ඇතුළු නොවේ.

(2) ජලය මඟින් බෝතලය මතට බලයක් යෙදේ.

(3) බෝතලයෙන් වායු බුබුළු පිටවේ.

(4) බෝතලය තුළ වාතය තිබී ඇත.



12. සමාන ස්කන්ධ සහිත බීකර තුනක් A, B, C ලෙස නම්කර ඒවාට පිළිවෙලින් මුහුදු ජලය, කලපු ජලය, ළිං ජලය සමාන පරිමා දමා තෙදඬු තුළාවක් ආධාරයෙන් ස්කන්ධය මනින ලදී.

ස්කන්ධය වැඩිවන ආකාරයට නිවැරදිව දැක්වෙන්නේ,

(1) A, B, C

(2) C, B, A

(3) B, C, A

(4) A, C, B




13. දණ්ඩ චුම්බකයක ආකර්ෂණ බල වැඩිපුරම ඇත්තේ,

(1) උත්තර ධ්‍රැවයේ ය. (2) දක්ෂිණ ධ්‍රැවයේ ය.

(3) චුම්බකයේ මධ්‍යයේ ය. (4) චුම්බක ධ්‍රැව දෙකෙහිම ය. (එහි දෙකෙළවරය)

14. යම් සංසිද්ධියක් පිළිබඳව සිසුවෙකු පැවසූ වදන් කිහිපයක් පහත දැක්වේ.

(a) අවර්ණ හුනු දියර තුළට ප්‍රශ්වාස වාතය යැවූ විට හුනු දියර කිරිපාට වේ.

(b) තවදුරටත් ප්‍රාශ්වාස වාතය යවන විට හුනු දියර අවර්ණ වේ.

(c) ප්‍රාශ්වාස වාතයේ කාබන්ඩයොක්සයිඩ් අඩංගු වේ.

සත්‍ය වගන්තිය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) a (2) b (3) a හා b (4) a, b හා c යඩි

15. ශ්‍රී ලංකාවේ සුළං බලාගාරය ඇති ස්ථානයකි,

(1) හම්බන්තොට (2) රන්දෙනිගල (3) ලක්ෂපාන (4) සපුගස්කන්ද

16.




A




B

ජීවින්ගේ වර්ධනය සිදුවන ආකාරය A හා B ප්‍රස්තාරවලින් පෙන්වයි. ඒ අනුව සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) A වලින් ශාකවල වර්ධනය පෙන්වන අතර යම් කාලයක දී වර්ධනය නියත වේ.

(2) B වලින් සතුන්ගේ වර්ධනය පෙන්වන අතර ජීවිතකාලය පුරාම වර්ධනය සිදු වේ.

(3) A වලින් ශාකවල වර්ධනය පෙන්වන අතර ජීවිතකාලය පුරාම වර්ධනය සිදු වේ.

(4) B වලින් ශාකවල වර්ධකය පෙන්වන අතර යම් කාලයක දී වර්ධනය නියත වේ.

17. ඒක බීජ පත්‍රී ශාක පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) උණ, කොස්, පොල්  (2) පුවක්, කිතුල්, තුත්තිරි

(3) කජු, අඹ, දෙල්  (4) මෑ, මුං, බෝංචි

18. නොවිකා ගිලීම සිදුකර සතෙකි,

(1) ගෙම්බා  (2) මුවා  (3) ගවයා  (4) කොටියා

19. ශාකයක (පැළයක) වර්ධනය (උස) මැනීමට භාවිත කළ හැකි උපකරණයකි,

(1) ආර්ද්‍රතාමානය  (2) වෘද්ධිමානය  (3) පීඩනමානය  (4) පානමානය

20. බලශක්ති සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

(1) අනවශ්‍ය විදුලි බුබුළු නිවා දැමීමයි.

(2) LED විදුලි පහන් භාවිතය යි.

(3) ශීතකරණයේ දොර වැඩිවේලාවක් විවෘත ව තැබීමයි.

(4) ස්වාභාවික ආලෝකය ලැබෙන පරිදි දොර ජනෙල් සවිකිරීමයි.

උපදෙස්

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. (ලකුණු 16 යි)**
- **ඉතිරි ප්‍රශ්න 06න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙන ම කඩදාසියක් භාවිත කරන්න.**

01. (A) හය ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා විද්‍යාගාරය අවට පරිසරය නිරීක්ෂණය කරන ලදී. එහි දී ජීවීන්, ජීවීන්ගේ ලක්ෂණ, අජීවී ද්‍රව්‍ය ඒවායේ භෞතික ගුණ, පරිසරයේ විවිධ ස්ථානවල උෂ්ණත්වය ආදිය නිරීක්ෂණයට ලක්විය. ඔබත් එම කණ්ඩායමේ සාමාජිකයෙක් යැයි සිතා ඒ ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ඔබ සොයාගත් ද්‍රව්‍ය අතරින් අජීවී ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 01)

(2) ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීමට ඔබ රැගෙන ගිය උපකරණයක් ලියන්න. (ලකුණු 01)

(3) ජීවීන්ට පමණක් පොදු ලක්ෂණක් සඳහන් කරන්න. (ලකුණු 01)

(4) ඔබ දුටු ශාක හා සතුන් අතර ඇති මූලික වෙනස්කමක් සඳහන් කරන්න. (ලකුණු 01)

(5) ඔබ දුටු ජීවීන් අතරින් ස්වයංපෝෂී ජීවියෙක් නම් කරන්න. (ලකුණු 01)

(6) විද්‍යාගාර පරිශ්‍රයේ තිබූ පොකුණෙන් ලබාගත් ජලය සාම්පලයක් විද්‍යාගාර උපකරණයකින් නිරීක්ෂණය කළ විට, එහි ඉතා කුඩා ජීවීන් සිටින බව නිරීක්ෂණය විය.

(i) එම උපකරණයෙන් නිරීක්ෂණය වූ ජීවීන් හඳුන්වන පොදු නම කුමක් ද? (ලකුණු 01)

(ii) පියවි ඇසින් නොපෙනෙන එම ජීවීන් නිරීක්ෂණය කිරීමට යොදාගත් උපකරණය කුමක් ද? (ලකුණු 01)

(iii) ඔබ දුටු එවැනි ජීවියෙකුට උදාහරණයක් දෙන්න. (ලකුණු 01)

(iv) පොකුණු ජලයේ උෂ්ණත්වය මැනීමට භාවිත කළ උපකරණය කුමක් ද? (ලකුණු 01)

(7) ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ගුරුතුමිය විසින් ඔබට ලබාදුන් උපදෙසක් ලියන්න. (ලකුණු 01)

(8) ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හමු වූ ජීවීන් කීපදෙනෙක් දෙබෙදුම් සුචි ක්‍රමයකට වර්ග කර පහත දක්වා ඇත. එහි ඇති හිස් තැන් නිවැරදිව පුරවන්න.




(ලකුණු 1 × 5 = 05)

(vi) ඉහත සතුන් අතර සිටින යුෂ උරාබොන සතෙකු නම් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 16)

02. (A) ඝන පදාර්ථවලට සුවිශේෂ ගුණ ඇත. පහත සඳහන් ද්‍රව්‍යවල භෞතික ගුණ අනුව ඒවා වර්ග කර දක්වන්න.

අඟුරු කැබැල්ලක්, තඹ කම්බියක්, පුයර ස්වල්පයක්, ප්ලාස්ටික් පටි කැබැල්ල, යකඩ ඇණය, කළුගල් කැබැල්ල

ඉහත ද්‍රව්‍ය අතරින්,

(a) ආඝාත්‍ය ද්‍රව්‍යක් -

(b) තන්‍ය ද්‍රව්‍යක් -

(c) දැඩි ද්‍රව්‍යයක් -

(d) ප්‍රත්‍යාස්ථ ද්‍රව්‍යක් -

(e) භංගුර ද්‍රවයක් -

(f) ඉතා සිනිඳු ද්‍රව්‍යයක් -

(ලකුණු 1 × 6 = 06)

(B) ජලය (ද්‍රව) සතු ලක්ෂණයක් පෙන්වීමට ගුරුතුමිය සිදුකළ ක්‍රියාකාරකමක ඇටවුමක රූප සටහනක් පහත දැක්වේ.




A පෙරහන් කඩදාසියට පමණක් ජලය ඉසින ලදී.

(i) ජලය ඉසීමෙන් පසු සිදු වූ වෙනස්කමක් ලියන්න. (ලකුණු 01)

(ii) ඉහත ක්‍රියාකාරකමෙන් පෙන්වන්නේ ජලය සතු කුමන ගුණයක් ද? (ලකුණු 01)

(iii) පදාර්ථ සතු ලක්ෂණ කිහිපයක් හා ඊට නිදසුන් දක්වා ඇත. ඒ අනුව A හා b යා කරන්න.

| A | B |
|---|---|
| a. නිශ්චිත හැඩයක් හා පරිමාවක් ඇත. | ★ ජලය |
| b. නිශ්චිත හැඩයක් හා පරිමාවක් නැත. | ★ ගඩොල් |
| c. නිශ්චිත පරිමාවක් පමණක් ඇත. | ★ හඳුන්කූරු දුම |

(ලකුණු 03)

03. වර්ෂාවක දී පොළොව මතු පිටට වැටෙන ජලයේ හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා සිදුකළ ක්‍රියාකාරකමක රූපසටහනක් පහත දක්වා ඇත.




(A) (i) A හා B නම් කරන්න. (ලකුණු 02)

(ii) පස මතුපිට ශාක වැස්මක් (තණකොළ) තිබීමේ ප්‍රයෝජනයක් ලියන්න.

(ලකුණු 01)

(iii) ගල්, බොරලු, වැලි අතර රැඳී ඇති ජලය හඳුන්වන්නේ කෙසේ ද? (ලකුණු 01)

(B) ලවණතාව අනුව ජලය වර්ග කළ හැක.

(i) ස්වභාවිකව වැඩිපුර ම ලවණ දිය වී ඇත්තේ කුමන ජලයේ ද? (ලකුණු 01)

(ii) එම ජලය වාෂ්පීභවනය කර අපට ප්‍රයෝජනවත් දෙයක් නිපදවිය හැක. එම නිෂ්පාදනය කුමක් ද? (ලකුණු 01)

(C) (i) මිනිසා ජලයෙන් ලබාගන්නා ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 01)

(ii) ශාක වල පැවැත්මට ජලය වැදගත්වන ආකාරයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(iii) පාසලේ ජලය අපතේ යන ස්ථානයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(iv) ජලය දූෂණය සිදුවන ආකාරයක් ලියන්න. (ලකුණු 01)

(v) දූෂිත ජලය ශරීර ගතවීමෙන් වැලඳිය හැකි රෝගයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11)

04. හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

(සූර්යය, ජලය පොම්ප කිරීම, න්‍යෂ්ටික ශක්තිය, අඩු කිරීම, ගල් අඟුරු ශක්තිය, පුනර්ජනනීය, ෆොසිල, සුනාමිය, භූතාපය, ජෛව ස්කන්ධ)

(1) කාර්යය කිරීමේ හැකියාව ........................................ ලෙස හඳුන්වයි.

(2) ප්‍රධාන ශක්ති ප්‍රභවය ........................................ වේ.

(3) ඉතා සීඝ්‍රයෙන් අවසන් වෙමින් පවතින ශක්ති ප්‍රභවයකි ........................................ ඉන්ධන.

(4) අනාගතයේ දී ලෝකයේ වැඩුපර ම භාවිත කිරීමට සිදුවන ශක්ති ප්‍රභව විය හැක්කේ ........................................ ශක්ති ප්‍රභවය යි.

(5) දර, පිදුරු, ලී කුඩු ආදිය ........................................ වලට නිදසුන් වේ.

(6) අතීතයේ දී සුළඟේ ශක්තිය උදව් කරගෙන ........................................ සිදු කර තිබේ.

(7) මුහුදු රළ පහරේ අධික ශක්තිය හේතුවෙන් සිදු වූ අයහපත් සංසිද්ධියකි........................................ ය.

(8) ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශ වල උණු දිය ළිං දක්නට ලැබේ. එම ප්‍රදේශ වල ........................................ අධික වීම ඊට හේතුවයි.

(9) ශ්‍රී ලංකාවේ තාප විදුලි බලාගාරවල භාවිත කරන ........................................ ෆොසිල ඉන්ධනයකි.

(10) තාක්ෂණික උපක්‍රම භාවිත කරමින් පරමාණු වලින් ලබාගන්නා ශක්තිය ........................................ ලෙස හැඳින් වේ.

(11) ශක්තිය පරිභෝජනය ........................................ තුළින් අපට ශක්තිය ඉතිරි කරගත හැක.

(ලකුණු 1 × 11 = 11)

05. විද්‍යා ප්‍රදර්ශනයකට සිසුවෙක් සැදූ සෙල්ලම් කරත්තයක රූපයක් පහත දැක්වේ.

(A)




(1) මෙහි A හා B ලෙස දක්වා ඇති චුම්භක කුමන වර්ගයට අයත් වේ ද? (ලකුණු 01)

(2) කරත්තය ඉදිරියට ගමන් කිරීමට චුම්භකවල ධ්‍රැව කෙසේ පිහිටිය යුතු ද? (ලකුණු 01)

(3) පහත දක්වා ඇති චුම්බක වර්ග නම් කරන්න.




A



B



C

(4) චුම්බකවල භාවිත අවස්ථාවක් ලියන්න. (ලකුණු 01)

(B) චුම්බක පිළිබඳ දැනුම ඇසුරින් පහත සටහන පුරවන්න.

ප්ලාස්ටික් රූල, යකඩ ඇණය, පිත්ත බොත්තම, පිහිතලය

චුම්භකයට ආකර්ෂණය වේ. (i) .............................................

(ii) ......................... (iii) ......................... (iv) ......................... (v) .............................

(ලකුණු 05)

(මුළු ලකුණු 11)

06. (A) අවුරුදු දිනවල රතිඤ්ඤා හඬ, කොවුල් නාදය, මෙන් ම රබන් හඬ ද සුලබ ව ඇසේ.

(i) ඉහත දක්වා ඇති ස්වභාවික හා කෘත්‍රිම ශබ්ද වෙන වෙනම ලියන්න. (ලකුණු 01)

(ii) රබානේ හඬ තීව්‍ර කර ගැනීමට සිදු කරන උපක්‍රමයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(B) සිසුවෙක් ලෝහ බට යොදාගෙන සාදන ලද සංගීත භාණ්ඩයක් පහත දැක්වේ.



(i) මෙහි ශබ්දය ජනනය කළ හැක්කේ කෙදේ ද? (ලකුණු 01)

(ii) වැඩි ම තීව්‍රතාවයකින් යුත් හඬක් නඟන්නේ කවර බටය මඟින් ද? (ලකුණු 01)

(C) ශබ්දය සංගීතය ලෙසත් ඝෝෂා ලෙසත් ආකාර දෙකකි.

(i) ඝෝෂා ඇතිවන්නේ කෙසේ ද? (ලකුණු 01)

(ii) ඒ සඳහා උදාහරණයක් ලියන්න. (ලකුණු 01)

(iii) සංගීත නාද වුව ද ශබ්දය අධික වූ විට පීඩාකාරී විය හැක. එවැනි ශබ්ද ඇසීම නිසා කනට හානි පැමිණිය හැක. කන්වලට සිදුවන හානි වළක්වා ගැනීමට කළ හැකි උපක්‍රමයක් සඳහන් කරන්න.

(ලකුණු 01)

(iv) ශබ්දය උපදවන ක්‍රමය අනුව සංගීත භාණ්ඩ වර්ග කළ හැක. ඔබ දන්නා වාතකඳක් කම්පනය වීමෙන් හා පටලයක් කම්පනය වීමෙන් ශබ්දය උපදවන සංගීත භාණ්ඩ දෙකකට නිදසුන් වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11)

07. (A) අපට පෙනීම ඇතිවීම සඳහා ආලෝකය අවශ්‍ය වේ.

ආලෝකයේ ගමන් මාර්ගය නිරීක්ෂණය කිරීමට සිදුකළ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.




(i) ඉටිපන්දම් දැල්ල පෙනීමට නම් කාඩ්බෝඩ් කැබලිවල සිදුරු කෙසේ පැවතිය යුතු ද?

(ලකුණු 01)

(ii) සිසුවෙක් B කාඩ්බෝඩ් කැබැල්ල මදක් එහාට කරන ලදී. එවිට සිදු වන්නේ කුමක් ද?

(ලකුණු 01)

(iii) මෙයින් නිගමනය කළ හැකි දේ ලියන්න. (ලකුණු 01)

(B) ද්‍රව්‍ය තුළින් ආලෝකය ගමන් කිරීමේ හැකියාව අනුව ද්‍රව්‍ය වර්ග කළ හැක. පහත සඳහන් ද්‍රව්‍ය ඉහත කී ගුණය අනුව පාරදෘශ්‍ය, පාරභාසක, පාරාන්ධ ලෙස වෙන්කර ලියන්න.

(මල් වීදුරුව, බොර ජලය, තුනී වීදුරුව තහඩුව, කළු කඩදාසිය, සබන් වතුර, ප්‍රකාශ තන්තු)

| පාර දෘශ්‍ය | පාරභාසක | පාරාන්ධ |
|---|---|---|
| | | |

(ලකුණු 03)

(C) පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය හා අසත්‍ය ප්‍රකාශ තෝරා (✓) හෝ (✗) ලකුණ යොදන්න.

(i) ප්‍රභාසංස්ලේෂණය සඳහා ශාකවලට ආලෝකය අවශ්‍යය වේ. ( )

(ii) චන්ද්‍රයා දීප්ත වස්තුවකි. ( )

(iii) ඇතැම් ශල්‍යකර්ම සඳහා ලේසර් කිරණ යොදා ගනී. ( )

(iv) විදුලි බුබුළු ස්වාභාවික ආලෝක ප්‍රභවයකි. ( )

(v) ආලෝකය මගින් පණිවිඩ සම්ප්‍රේෂණය සිදු කළ හැක. ( )

(ලකුණු 05)

(මුළු ලකුණු 11)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**06 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය 2025** | **විද්‍යාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (4) | 03. (2) | 04. (1) | 05. (4) | 06. (2) | 07. (4) | 08. (1) | 09. (4) | 10. (1) |
| 11. (3) | 12. (2) | 13. (4) | 14. (4) | 15. (1) | 16. (3) | 17. (2) | 18. (1) | 19. (2) | 20. (3) |

එක් නිවැරදි පිළිතුරකට ලකුණ2 බැගින් ලකුණු 40 යි

## II කොටස

01. (1) ඕනෑම අජීවී ද්‍රව්‍යයකට (ලකුණු 01)
(2) අත්කාච, කතුරු, ඩැහි අඬු, පිහි නිදර්ශක එකතු කිරීමට, බොරතෙල්, කැමරා, උෂ්ණත්වමාන ආදිය. (ලකුණු 01)
(3) වර්ධනය, ශ්වසනය, ප්‍රජනනය, චලන දැක්වීම, පෝෂණය (ලකුණු 01)
(4) මූලික වෙනස්කම් සඳහා (ලකුණු 01) (5) ශාකයක් නම් කිරීම. (ලකුණු 01)
(6) (i) ක්ෂුද්‍ර ජීවීන් (ලකුණු 01) (ii) සංයුක්ත අණ්වීක්ෂය (ලකුණු 01)
(iii) ක්ලැමිඩොමොනාස්, ඇමීබා, පැරමීසියම් වැනි ජීවීන් (ලකුණු 01)
(iv) උෂ්ණත්වමානය (ලකුණු 01)
(7) උපදේශයකට (ලකුණු 01)
(8) (i) පිටකටුවක් නැත. (ලකුණු 01) (ii) ගොළුබෙල්ලා (ලකුණු 01)
(iii) සමනලයා (ලකුණු 01) (iv) ගෙම්බා (ලකුණු 01)
(v) කටුස්සා (ලකුණු 01) (vi) සමනලයා (ලකුණු 01)
(මුළු ලකුණු 16)

02. (A) නිවැරදි පිළිතුරු ලිවීම. (ලකුණු 06)
(B) (i) A පෙරහන් කඩදාසිය ඇති පැත්ත පහත් විය. (ලකුණු 01)
(ii) ස්කන්ධයක් ඇති බව. (ලකුණු 01)
(iii) a. ගඩොල b. හඳුන්කූරු දුම c. ජලය (ලකුණු 03)
(මුළු ලකුණු 11)

03. (A) (i) A - වර්ෂණය (ලකුණු 01) B - මතුපිට ජලය (ලකුණු 01)
(ii) පස සෝදායාම වැළැක්වීම. / පාංශු ඛාදනය අඩුවීම වැනි. (ලකුණු 01)
(iii) භූගත ජලය (ලකුණු 01)
(B) (i) මුහුදු ජලය / සාගර ජලය / කරදියේ (ලකුණු 01) (ii) ලුණු (ලකුණු 01)
(C) (i) ප්‍රයෝජනයකට (ලකුණු 01) (ii) ජලය වැදගත්වන ආකාරයට (ලකුණු 01)
(iii) ලිං, ජලනල ආශ්‍රිතව (ලකුණු 01) (iv) ජල දූෂණය වන ආකාරයට (ලකුණු 01)
(v) රෝගයට (ලකුණු 01)
(මුළු ලකුණු 11)

04. (1) ශක්තිය (2) සූර්යයා (3) ෆොසිල (4) පුනර්ජනනීය
(5) ජෛව ස්කන්ධ (6) ජලය පොම්පකිරීම. (7) සුනාමිය (8) භූ තාපය
(9) ගල් අඟුරු (10) න්‍යෂ්ටික ශක්තිය (11) අඩු කිරීම. (ලකුණු 1 × 11 = 11)

05. (A) (1) දණ්ඩ (ලකුණු 01) (2) සජාතිය ධ්‍රැව / එකම ජාතියේ ධ්‍රැව (ලකුණු 01)
(3) A. U හැඩැති B. චුරප චුම්භකය C. පෙති චුම්භකය (ලකුණු 03)
(4) භාවිත අවස්ථාවක් සඳහා (ලකුණු 01)
(B) (i) චුම්බකයට ආකර්ෂණය නොවේ. (ලකුණු 01) (ii) යකඩ ඇණය (ලකුණු 01)
(iii) පිහිතලය (ලකුණු 01) (iv) ප්ලාස්ටික් රූල, පිත්තල බොත්තම (ලකුණු 04)
(මුළු ලකුණු 11)

06. (A) (i) ස්වාභාවික ශබ්ද - කොවුල් නාදය
කෘතිම ශබ්ද - රබන් හඬ, රතිඤ්ඤා හඬ (ලකුණු 03)
(ii) රත්කිරීම (ලකුණු 01)
(B) (i) තට්ටුකිරීමෙන් (ii) කොටම බටය මගින් / කුඩාම බටය (ලකුණු 01)
(C) (i) රිද්මයානුකූල නොවන අවිධිමත් ශබ්ද (ලකුණු 01) (ii) උදාහරණයකට (ලකුණු 01)
(iii) කන් ආරක්ෂිත උපකරණයකට (ලකුණු 01)
(iv) උපකරණ දෙක නිවැරදිව සඳහන් කිරීමට (ලකුණු 02)

07. (A) (i) සරල රේඛීයව (ලකුණු 01) (ii) ඉටිපන්දම් දැල්ල නොපෙනේ (ලකුණු 01)
(iv) ආලෝකය සරල රේඛීයව ගමන් කරන බව. (ලකුණු 01)
(B) නිවැරදිව වර්ග කර ලිවීම. (ලකුණු 03)
(C) (i) ✓ (ii) ✗ (iii) ✓ (iv) ✗ (v) ✓ (ලකුණු 05)
(මුළු ලකුණු 11)